# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2023

2026 ජනවාරි / පෙබරවාරි

**සමාජීය විද්‍යා පීඨය**

**ජාත්‍යන්තර අධ්‍යයනය**

**(නව නිර්දේශය)**

**සාමය හා ගැටුම් නිරාකරණය**

**INTS 38224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ගැටුම්වල ස්වභාවය කාලයත් සමඟ වෙනස් වන්නේ කෙසේද යන්න පැහැදිලි කරමින්, ගැටුමක් හසුරුවීමේ දී භාවිතා කරන විවිධ ප්‍රවේශයන්ගේ සීමා සහ හැකියාවන් විශ්ලේෂණාත්මකව සාකච්ඡා කරන්න.

02. ගැටුම් නිරාකරණයට තෙවන පාර්ශව මැදිහත් වීම අත්‍යවශ්‍ය වන්නේ කුමන අවස්ථාවලද? එහි වාසි, සීමා සහ අසාර්ථකවීමට හේතු උදාහරණ සමඟ විශ්ලේෂණය කරන්න.

03. කලාපීය සංවිධාන සාමය සහ ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ දී ජාත්‍යන්තර සංවිධානවලට වඩා වෙනස් භූමිකාවක් ඉටු කරන්නේ කෙසේද? අප්‍රිකානු මහද්වීපයෙන් උදාහරණ යොදා ඔබේ පිළිතුර විග්‍රහ කරන්න.

04. පහත ප්‍රශ්නයේ කොටස් දෙකකට පිළිතුරු සපයන්න.

    i. දකුණු චීන මුහුද සම්බන්ධ ආරවුල ගෝලීය බලතුලනය (balance of power) වෙනස් කිරීමට හැකි සාධකයක් ලෙස සැලකිය හැක්කේ ඇයි?

    ii. මෙම ආරවුල තුළ ජාත්‍යන්තර නීතිය සහ සාගර නීතිය (UNCLOS) ඉටුකරන භූමිකාව කුමක්ද?

    iii. ASEAN සහ අනෙකුත් බහුපාර්ශ්වික ක්‍රියාකරුවන් මෙම ආරවුල කළමනාකරණය කිරීමට දරන උත්සාහයන් අගයන්න.

05. පහත ප්‍රශ්නයේ කොටස් දෙකකට පිළිතුරු සපයන්න.

    i. ඊශ්‍රායල - පලස්තීන ගැටුම දිගුකාලීන ගැටුමක් බවට පත්වීමට බලපා ඇති ව්‍යුහාත්මක හා දේශපාලනික සාධක මොනවාද?

    ii. ජාත්‍යන්තර ප්‍රජාව විසින් මෙම ගැටුමට ප්‍රතිචාර දක්වා ඇති ආකාරය සහ එහි සාර්ථකත්වය විග්‍රහ කරන්න.

    iii. මෙම ගැටුමට සාමකාමී විසඳුමක් සෙවීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග මොනවාද?

06. පහත සඳහන් ගැටුම් අතරින් **එකක්** තෝරාගෙන, එම ගැටුම කලාපීය අර්බුදයක සිට ගෝලීය අර්බුදයක් දක්වා පරිණාමය වූ ආකාරය විස්තර කරන්න.

i. සුඩාන අභ්‍යන්තර ගැටුම්

ii. රුසියානු - යුක්රේන යුද්ධය

iii. කාශ්මීර ප්‍රශ්නය

07. පහත ප්‍රශ්නයේ කොටස් **තුනකට** පිළිතුරු සපයන්න.

i. න්‍යෂ්ටික සහ සාම්ප්‍රදායික අවි පාලනය කිරීමේ උත්සාහයන්ට වර්තමානයේ මුහුණදීමට සිදුවන ප්‍රධාන දේශපාලනික හා ආරක්ෂක අභියෝග මොනවාද?

ii. අවි ආයුධ රාජ්‍ය බලය සහ ජාත්‍යන්තර බල තරගය ශක්තිමත් කිරීමේ මෙවලමක් ලෙස භාවිතා වන්නේ කෙසේද?

iii. නිරායුධකරණය සහ අවි පාලනය අතර පවතින මූලික වෙනස පැහැදිලි කරමින්, එයින් වත්මන් ලෝක දේශපාලනයට ඇති බලපෑම විග්‍රහ කරන්න.

08. පහත මාතෘකා අතරින් මාතෘකා **හතරක් (04)** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. සීතල යුද්ධයෙන් පසු යුරෝපීය ආරක්ෂක ව්‍යුහයේ වෙනස්වීම්

ii. ගැටුම් වැළැක්වීම (Conflict Prevention)

iii. අභ්‍යන්තර සහ අන්තර් රාජ්‍ය ගැටුම් අතර වෙනස

iv. සහජ ආවේගශීලී න්‍යාය (Instinct Theory) අනුව ගැටුම

v. ගැටුම් විපරිවර්තනය (Conflict Transformation)

*******************************